**තලාව ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**---------------------------**

## 01. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**----------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 06 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 01 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 අගෝස්තු 31 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

**------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර ,මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට තලාව ප්‍රදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

**------------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

**-----------------------**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පළාත් ආදායම් දෙපාර්තමේන්තුවෙන් එවන ලද වාර්තා අනුව 2015 දෙසැම්බර් 31 දිනට සභාවට ලැබියයුතු හිඟහිටි මුද්දර ගාස්තු ශේෂය රු.2,510,840 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල එම අගය රු.1,500,000 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ හිඟහිටි මුද්දර ගාස්තු ශේෂය රු.1,010,840 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 2015 සැප්තැම්බර් මාසයට අදාළ රු.490,417 ක උසාවි දඩ ආදායම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කර නොතිබුණි.

(ඇ) ප්‍රාදේශිය සභාව සතු අංක LL - 7711දරන කැබ් රථය, අංක LL –6932 දරන ටිපර් රථය හා අංක LL -7315 දරන ලොරි බවුසරය යන වාහනවල වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ස්ථාවර වත්කම් ලේඛනය අනුව එකතුව රු.258,900 ක්වූ ස්ථාවර වත්කම් 04 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි

**02.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අනුව සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.8,645,956 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.9,424,473 ක් විය.

**2.2** **ආදායම් පරිපාලනය**

**2.2.1** **බදු කුලී**

සභාවට අයත් කඩ කාමර කුලියට දීමෙන් ලැබියයුතු කඩකුලිය නියමිත දිනට අයකර නොගැනීම හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දින වනවිට කඩ කාමර 50 ක් සඳහා වූ සමුච්චිත හිඟ කඩ කුලිය රු.2,847,335 ක් වූ අතර එම මුදල 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (I) ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2** **මුද්දර ගාස්තු**

(අ) 2009 සිට 2014 දක්වා කාලය තුල සභාවට ලැබියයුතු රු.2,510,840 ක්වූ මුද්දර ගාස්තු සමාලෝචිත වර්ෂයේදීද අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළව ලැබියයුතු මුද්දර ගාස්තු ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

**03.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

(අ) තලාව ප්‍රාදේශීය සභාවේ අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු තනතුරු 11 ක් සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය තුලදී අනියම් හා කොන්ත්‍රාත් සේවකයින් 22 දෙනෙකු සේවයේ යොදවා ගැනීම වෙනුවෙන් ප්‍රතිපූර්ණය නොවන වැටුප් සඳහා සභා අරමුදලින් රු.4,568,485 ක් ගෙවා තිබුණි.

(ආ) එකතුව රු.712,923 ක්වූ සහතික නොකල ගෙවීම් වවුචර් 14 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී ගෙවීම්කර තිබුණි.

(ඇ) අවස්ථා 5 ක දී රු.286,290 ක ගබඩා සැපයුම් සඳහා ගෙවීම් කිරීමේදී 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 115 ප්‍රකාරව ගබඩාභාර නිලධාරියා විසින් ගෙවීම් වවුචරයට සහතිකයක් ලබාදී නොතිබුණි.

**3.2 වත්කම් කළමනාකරණය**

**----------------------------**

**නිශ්ක්‍රීය වත්කම්**

**---------------------**

සභාව සතුව පවතින රු.4,278,696 ක්වූ වාහන 03 ක්, බේකරි කට්ටලය හා ඝනඅපද්‍රව්‍ය රැස්කිරීමේ මධ්‍යස්ථානය වසර 5කට අධික කාලයක් තිස්සේ කිසිදු ප්‍රයෝජනයකට ගැනීමකින් තොරව නිශ්ක්‍රීයව පැවතුණි.

**3.3 ආර්ථික නොවන ගනුදෙනු**

**------------------------------**

තලාව ප්‍රාදේශීය සභාව විසින් තම්මැන්නාවැව ස්වභා උද්‍යානයක් ලෙස සංවර්ධනය කිරීම සහ පුරනැගුම ව්‍යාපෘතියට අදාල උප ව්‍යාපෘති දෙකක් සඳහා ව්‍යාපෘති යෝජනා සකස් කිරීම වෙනුවෙන් සභාවේ සේවයේ නියුතු තාක්ෂණික නිලධාරියෙකුගේ සේවය ලබාගැනීමට කටයුතු නොකර බාහිර පුද්ගලයකු යොදාගෙන ඒ සඳහා රු.60,000 ක් ගෙවීම් කර තිබුණි.

**3.4 කොන්ත්‍රාත් පරිපාලනය**

**-----------------------------**

ඇස්තමේන්තුගත වටිනාකම රු.1,905,924 ක්වූ ව්‍යාපෘති 17 ක් වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන් ඉදිරිපත් නොවීම හා සමාලෝචිත වර්ෂය අවසාන සතියේ අනුමත වී තිබෙන තත්ත්වයන් තුල එම ව්‍යාපෘති අත්හැර දැමීම හේතුවෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවට ලැබිය හැකිව තිබුණු විවිධ පහසුකම් නොලැබීයාමක් සිදුවී තිබුණි.

**3.5 ව්‍යාපෘති ප්‍රමාද කිරීම**

**-------------------------**

සමාලෝචිත වර්ෂයේ ගිවිසුම්ගතව තිබුණු ඇස්තමේන්තු වටිනාකම රු.1,039,500 ක් වූ ව්‍යාපෘති 03 ක වැඩ කටයුතු 2016 මැයි මාසය වන විටද අරම්භ කර නොතිබුණි.

**04. පද්ධති හා පාලනය**

**----------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය